**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ පුරප්පාඩු 31 ක් සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 ඔක්තෝබර් මාසයේ දී කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

***01. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :***

*අධ්‍යාපන සුදුසුකම් :-*

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. ආර්ථික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයන යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

*සංලක්ෂය* - අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ විභාගයට අයදුම්කරන භාෂා මාධ්‍යය වේ.

*වෘත්තීය සුදුසුකම් :-*

I. ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම;

*හෝ*

II. ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම;

*හෝ*

III. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්ව තිබීම;

*හෝ*

IV. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත්ව තිබීම;

*හෝ*

V. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

***සැ. යු.*** - ඉහත සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් 2026.09.23 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුයි.

**02.** *වෙනත් සුදුසුකම් :-*

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි විය යුතුය.

2.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වයඹ පළාත තුළ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.

2.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

2.5 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ අධ්‍යාපන, වෘත්තීය, වෙනත් සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

***සංලක්ෂය :-*** යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

**03.** ***වැටුප් පරිමාණය:-*** මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 - 2025 අනුව, රු. 52,250 – 800 x 10 – 1,190 x 11 – 1,320 x 10 – 1,350 x 10 – රු. 100,040 /- වේ.

(2027.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

**04.** ***සේවා කොන්දේසි:-***

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුල සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවිනතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීනතාවය නියමිත මට්ටමට ලබා ගත යුතුය.

4.5 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීතිවලට ද වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

**05.** ***බඳවා ගැනීමේ ක්‍රමය:-***

5.1 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

5.2 විභාග විෂයය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ විෂයයන් 02 හිම ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

5.3 පවතින පුරප්පාඩු සියල්ල විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ලැබේ

**06.** ***ලිඛිත විභාගය :-***

6.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශයන් පහත පරිදි වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |

***විෂයය නිර්දේශ :-***

01. *බුද්ධි පරීක්ෂණය :*

අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයන් ද විශ්ලේෂණ හැකියාවන් ද තීරණ ගැනීමේ ශක්තීන් ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි.

02. *සාමාන්‍ය දැනීම* :

*(අ)* ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම.

*(ආ)* සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි.

**07.** ***විභාග ගාස්තු :-***

විභාග ගාස්තු වශයෙන් රු.1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු.02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. ව.ප.ස.මු.02 ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් විය හැක.)

**08.** ***අයදුම් කළ යුතු ක්‍රමය :-***

8.1 අයදුම් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

*(අ)* මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදු කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **exams.psc.nw.gov.lk** දරන වෙබ් අඩවියට පිවිස එහි දක්වා ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

*(ආ)* **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.09.23 වේ**

*(ඇ)* මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත PDF ආකාරයෙන් බාගත කර, එය මුද්‍රණය කර, විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත **2026.09.30** දිනට හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි

තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මඟින් එවිය යුතුය. (මුද්‍රිත පිටපතෙහි, ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"සමුපකාර සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

8.2 නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

11. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබිණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතුය

12. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක් ම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

13. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :-

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

*හෝ*

*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

***සටහන :*** විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔහු /ඇය විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

.
08-244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.